ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2288/30 - 2022 ජූලි මස 17 වැනි ඉරිදා - 2022.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## වැඩ බලන ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශන ආදිය

වැඩ බලන ජනාධිපතිවරයා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව) විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

රනිල් වික්‍රමසිංහ

ශ්‍රී ලංකාවේ මහජන හදිසි අවස්ථා තත්ත්වයක් පැවතීම හේතුකොට ගෙන මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා මහජන ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යෑම සඳහා මෙසේ කිරීම අවස්ථානුකූලයැයි මා අදහස් කරන හෙයින් ;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව වැඩ බලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, 1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් සංශෝධිත (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඒ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම දෙදහස් විසි දෙකක් වූ ජූලි මස 18 වන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මේ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරමි.

වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජූලි මස 17 වන දින කොළඹ දී අත්සන් කරන ලදී.

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව) වැඩ බලන ජනාධිපතිවරයාගේ අණ පරිදි,

ගාමිණී සෙනරත්,
ජනාධිපති ලේකම්.

1A - G 37080— 366 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*